මාධ්‍යනිවේදනඅංක :PE/2024/04 2024.09.30

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024
## තැපැල් ඡන්දදායකයින්ගේ පහසුව සඳහා ඡන්ද හිමි නාමලේඛන ප්‍රදර්ශනය කිරීම

2024 නොවැම්බර් මස 14 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණය සඳහා භාවිතා කරනු ලබන්නේ 2024 වර්ෂයේ සහතික කරන ලද ඡන්ද හිමි නාමලේඛනය බැවින් තැපැල් ඡන්ද හිමියන්ගේ පහසුව සඳහා දිවයිනේ සියළුම මැතිවරණ කොට්ඨාසවලට අදාළ 2024 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛන 2024 ඔක්තෝබර් මස 01 වෙනි දින සිට සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළ පහත සඳහන් ස්ථානවල ප්‍රදර්ශනය කෙරේ.

* සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල (කච්චේරිවල)
* සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල } අදාළ බල ප්‍රදේශයට අයත් වන
* සියලුම ග්‍රාම නිලධාරි කාර්යාලවල } ඡන්ද ප්‍රදේශයේ නාමලේඛනය

ඉහත සඳහන් ස්ථානවලට අමතරව,

- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
- කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05.
- අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, 243/3/ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
- තැපැල් මුලස්ථානය, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.
- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, මාලිගාවත්ත.
- නාගරික සංවර්ධන අධිකාරිය, සෙත්සිරිපාය පළමු අදියර කාර්යාල සංකීර්ණය, බත්තරමුල්ල යන ස්ථානයේ, කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ කාර්යාල සංකීර්ණවල ඡන්දහිමි නාමලේඛන තොරතුරු පරිගණක ආශ්‍රයෙන් අයදුම්කරුවන් වෙත ලබාදීමට කටයුතු කරනු ඇත.

ඉහත සඳහන් කළ ප්‍රදර්ශන ස්ථාන අතුරින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල එම දිස්ත්‍රික්කයට අදාළව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා ග්‍රාම නිලධාරි කාර්යාලවල එම බල ප්‍රදේශයට අදාළව පොත් වශයෙන් සකස් කරන ලද ඡන්ද හිමි නාමලේඛන පිටපත් ප්‍රදර්ශනයට තබා ඇත.

එබැවින් සියලුම තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ට දිවයිනේ සියලුම දිස්ත්‍රික්කවලට අදාළ ඡන්ද හිමි නාම ලේඛන විස්තර අඩංගු මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.elections.gov.lk මඟින් තොරතුරු තාක්ෂණ සේවාවක් (e-service) භාවිතයෙන් අයදුම්කරුවන් වෙත තොරතුරු ලබාදීමට අවශ්‍ය කටයුතු සලසා ඇත. ඉහත ප්‍රදර්ශන ස්ථාන හා තමන්ගේ සේවා ස්ථානවල සහතික කිරීමේ නිලධාරීන් වෙත ගොස් අයදුම්කරු පදිංචි දිස්ත්‍රික්කය හා හැඳුනුම්පත් අංකය ඉදිරිපත් කළ පසු තැපැල් ඡන්ද ඉල්ලුම්පත් සම්පූර්ණ කිරීමට අදාළ තොරතුරු ලබා ගත හැකි අතර ජාතික හැඳුනුම්පත් අංක නොමැති අයදුම්කරුවන්ට ඡන්ද හිමි නාමලේඛන පොත් වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන ඉහතින් සඳහන් කළ ඕනෑම ස්ථානයකින් එම තොරතුරු ලබාගත හැකිය. නොඑසේ නම් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ 1919 ඇමතීම මඟින් ද ලබාගැනීමට අවකාශ සලසා ඇත.

**පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් සපුරා ඇති එමෙන්ම පසුගිය ජනාධිපතිවරණය සඳහා තැපැල් ඡන්ද අයදුම්කළ සියලුම දෙනා මෙම ඡන්ද විමසීම සඳහා නැවතත් ස්වකීය තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්යය බව අවධාරණය කරනු ලැබේ.**

සියළුම දිස්ත්‍රික්කවල තැපැල් ඡන්ද අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඒ ඒ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත එනම් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලිපිනයට යොමු කළ යුතු වේ.

**එක හා සමාන පුද්ගල නාම පවතින හෙයින් තමන්ගේ තොරතුරු වෙනත් අයෙකු ලවා පරීක්ෂා කොට තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීමෙන් වළකින ලෙස තැපැල් ඡන්ද අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

තැපැල් ඡන්ද පහසුකම් ලබාගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු වන අයදුම්පත් ඡන්ද හිමි නාමලේඛන ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානවලින්, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් නොමිලේ ලබාගත හැකි අතර, මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් ද බාගත කළ හැකි ය. **තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති සියලු දෙනාගේම අයදුම්පත් 2024 ඔක්තෝබර් 08 දින හෝ එදිනට පෙර හෝ අදාළ දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී වෙත ලැබී තිබිය යුතු ය. අයදුම්පත්‍ර භාරගැනීම අවසන් දිනයේ දී එනම්, 2024 ඔක්තෝබර් 08 දින මධ්‍යම රාත්‍රී 12.00 ට පෙර ඒවා නියමිත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට ලැබිය යුතු අතර, එදිනට අයදුම්පත්‍ර තැපෑලට භාරදීම පමණක්, එම අයදුම්පත්‍ර පිළිගැනීම සඳහා හේතුවක් නොවේ.**

තැපැල් ඡන්ද අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනය 2024.10.08 බැවින් එදින හෝ එදිනට පෙර ලැබෙන සේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසු ලැබෙන අයදුම්පත් සලකා බැලීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් කඩිනමින් ඔබගේ අයදුම්පත නියමිත සහතික කිරීමේ නිලධාරී මගින් අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත යොමු කිරීමට පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

2024.10.07 සහ 08 දිනවල සම්පූර්ණ කරනු ලබන ඕනෑම දිස්ත්‍රික්කයකට අදාළ තැපැල් ඡන්ද අයදුම්පත් එක් එක් තේරීම්භාර නිලධාරීන් වෙත වෙන වෙනම කවරවල බහා ආසන්න දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත භාරදිය හැකි බවද වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්